## ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව

## රත්නපුර දිස්ත්‍රික්කය

01. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 26 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූනි 27 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය.
---------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මහජන බැංකුව - ගොඩකවෙල ගිණුම් අංක 245-1-001-7-0000050 දරණ රැක්කිරීම් ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 321,068 ක් බවට බැංකුව විසින් තහවුරු කර තිබියදී බැංකු සැසඳුමේ රු.358,362 ක් ලෙස දක්වා තිබීමෙන් රු. 37,294 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) 2015 වර්ෂය තුල රු. 5,500,000 ක් වටිනා වාහන හා රු. 5,500,000 ක් වටිනා බැකෝ ලෝඩර් යන්ත්‍රයක් පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් සභාවට ප්‍රදානය කර ඇති අතර, එම වටිනාකම වන රු. 11,000,000 ක් ප්‍රාග්ධන යෙදුමට දායක වීම ලෙසත් සංචිත ගිණුමකට බැර කර වෙනම දැක්විය යුතු වුවත්, ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමට බැර කර තිබුණි. ඒ අනුව සභාව විසින් මුදලට ගන්නා සහ ප්‍රදාන වශයෙන් ලැබෙන ස්ථාවර වත්කම් ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීම යන එකම ගිණුමක සටහන් කර තිබුණි.

(ඇ) සමුච්චිත අරමුදල හරහා මුදලින් කල ගෙවීම් වල වටිනාකම රු. 1,844,438 ක් වුවත්, ගෙවීම් ගිණුම් වලට සටහන් කිරීමේදී සමුච්චිත අරමුදලට රු. 1,790,002 ක් හර කර තිබුණි. තවද, ණයහිමියන්ට මුදලින් කල ගෙවීම් වල වටිනාකම රු. 2,618,759 ක් වුවත්, ගිණුම් වලට සටහන් කිරීමේදී ණයහිමියන්ට ගෙවීම් ලෙස රු. 2,673,195 ක් සටහන් කර තිබුණි. ඒ අනුව සමුච්චිත අරමුදලේ ශේෂය රු. 54,436 ක් අඩුවෙන් පෙන්නුම් කරන අතර, රු. 54,436 ක් ණයහිමියන් අඩුවෙන් පෙන්නුම් කරයි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව සකස් කර අදාල නිර්දේශ ඉදිරිපත් කිරීමට පෙර රු. 46,931 ක්වූ වත්කම් ගිණුම් වලින් ඉවත් කිරීම මඟින් ස්ථාවර වත්කම් අගය රු. 46,931 ක් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි.

(ඉ) සේවක ඇප තැන්පත් සහ සේවක ඇප ආයෝජන ගිණුම් ශේෂයන් එකිනෙකට සමාන විය යුතු වුවත්, එම ශේෂ 02 අතර රු. 98,996 ක වෙනසක් විය.

(ඊ) සමාලෝචිත වර්ෂය ආරම්භයේදී හිඟහිටි වැටුප් ප්‍රතිපූර්ණ මුදල් වශයෙන් රු. 1,643,145 ක් ලැබිය යුතුව තිබූ අතර, එම මුදල් ප්‍රධාන ලෙජර් ගිණුම සමඟද ගැලපුණි. එසේ වුවද ජ'නල් සටහන් අංක 15 මඟින් රු. 60,000 ක මුදලක් සමුච්චිත අරමුදල හර කර හිඟහිටි වැටුප් ප්‍රතිපූර්ණ ගිණුම බැර කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් හා සමුච්චිත අරමුදලේ ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

----------------------------

ගිණුම් විෂයයන් 09 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛණ අනුව ශේෂයන් අතර රු. 4,805,445 ක වෙනසක් දක්නට ලැබුණි.

1.3.3 ලැබිය යුතු ගිණුම්

-------------------

වාරික 60 කින් ගෙවීමේ එකඟතාවය මත 2010 නොවැම්බර් මස කල්බදු ක්‍රමයට මිලදී ගත් කැබ් රථය සඳහා 2015 ජනවාරි 01 දිනට රු. 1,499,790 ක් ගෙවිය යුතුව තිබුණි. ඒ අනුව අවසන් වාරිකය එනම්, 60 වන වාරිකය වන රු. 149,979 ක් ගෙවා එම ණයහිමි ශේෂය සම්පූර්ණයෙන්ම පියවා තිබුණද, නැවතත් 2015 දෙසැම්බර් 15 දින රු. 160,973 ක් ගෙවා තිබුණි. ඒ අනුව එකඟ වූ මුදලට වඩා රු. 160,973 ක් සභාව විසින් ලීසිං සමාගමට ගෙවා ඇති අතර, එලෙස වැඩිපුර ගෙවා ඇති මුදල සභාවට අය කර ගත යුතුව ඇත.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකතුව රු. 81,286,727 ක්වූ ස්ථාවර වත්කම් පිළිබඳ උප ලේඛනයක් ඉදිරිපත් නොවුණි.

(ආ) 2010 වර්ෂයේදී ගොවි සංවිධාන 02 කට රු. 550,000 ක අත්තිකාරම් ලබාදී තිබූ නමුත්, එම අත්තිකාරම් කුමන කර්මාන්තය වෙනුවෙන් ලබා දුන්නේද හෝ එම අත්තිකාරම් පියවීම හෝ කර්මාන්තය ඉටු කර තිබේද යන්න පරීක්ෂා කිරීම සඳහා අදාල ලිපිගොනු විගණනයට ඉදිරිපත් නොවීය.

1.3.5 නීති රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

------------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව. | අනුකූල නොවීම්. |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (I) මුදල් රෙගුලාසි අංක 102 හා 760 | 2014 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය අනුව අස්ථානගතවූ හෝ පෞද්ගලිකව රැගෙන ගොස් ආපසු භාර නොදුන් බවට හඳුනාගෙන තිබූ ලැප් ටොප් පරිගණක 02 ක් සහ පුටු ආදී භාණ්ඩ සම්බන්ධයෙන් වගකිව යුතු තැනැත්තන් හඳුනා ගෙන ඒවායේ |

වටිනාකම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

| | | |
|---|---|---|
| (II) | මුදල් රෙගුලාසි අංක 177(1) | යොමුගත රෙගුලාසියට පටහැනිව සමාලෝචිත වර්ෂයේ අවස්ථා 219 කදී එකතු කරන ලද වරිපනම් බදු, වෙළඳ බලපත්‍ර හා ව්‍යාපාර බදු රු.2,172,944 ක් එකතු කිරීමේ නිලධාරීන් විසින් දින 05 සිට දින 24 දක්වා කාල සීමාවක් ප්‍රමාද කර සභාවට ප්‍රේෂණය කර තිබුණි. |
| (III) | මුදල් රෙගුලාසි අංක 396(ඇ) | නිකුත් කල නමුත් ඉදිරිපත් නොකල මාස 06 ක් ඉක්මවා තිබූ රු. 18,330 ක් වටිනාකමැති චෙක්පත් 05 ක් යොමුගත රෙගුලාසියට පටහැනිව තැන්පත් ගිණුමට බැර කර තිබුණි. |
| (IV) | මුදල් රෙගුලාසි අංක 571 | යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කල යුතු රු. 960,466 ක් වටිනා තැන්පතු සම්බන්ධයෙන් ක්‍රියා කර නොතිබුණි |

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 10,449,768 ක්වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 10,742,736 ක් විය.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය මෙහෙයුම් අතිරික්තය රු. 292,968 කින් අඩුවී තිබූ අතර, එය පසුගිය වර්ෂයට වඩා සියයට 2.7 ක අඩුවීමක් බව නිරීක්ෂණය විය. මෙයට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ආදායම් වල අඩුවීම හා පුනරාවර්තන වියදම්හි වැඩිවීමයි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| --- | --- | --- | --- |
| | රු. '000' | රු. '000' | රු. '000' |
| වරිපනම් හා බදු | 7,192 | 4,143 | 4,565 |
| බදු කුලී | 8,467 | 7,135 | 401 |
| බලපත්‍ර ගාස්තු | 935 | 1,546 | - |
| වෙනත් ආදායම් | 44,722 | 35,912 | 9,986 |

2.3.2. ආදායම් රැස්කිරීමේ කාර්යයසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී වරිපනම් බදු, බදුකුලී, වරෙන්තු හා දඩ ආදායම් යන ආදායම් විෂයයන්හි රැස්කල ආදායම, අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 30, සියයට 11 හා සියයට 82 ක අඩුවීමක් පෙන්නුම් කෙරිණි.

2.3.3 වරිපනම් බදු

සභා බල ප්‍රදේශයේ 2015 සැප්තැම්බර් 30 දිනට වරිපනම් බදු ශේෂය රු. 2,277,262 ක්වූ අතර, එයින් රු. 5,000 ට වඩා වැඩි හිඟයක් පවතින වරිපනම් බදු කරුවන් 59 දෙනෙකුගෙන් රු. 963,941 ක් අයවිය යුතු අතර, එය මුළු හිඟ වටිනාකමින් සියයට 42 ක් විය.

2.3.4 වෙනත් ආදායම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ජනරජයේ 2014 දෙසැම්බර් 05 දිනැති අංක 1892 දරන ගැසට් නිවේදනය ප්‍රකාරව සභා බල ප්‍රදේශය තුල දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් දැන්වීමේ වර්ග අඩියකට රු.100 බැගින් අයකර ගත යුතුය. ප්‍රදේශයේ ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරු මඟින් ආදායම් ලබා ගැනීමට කටයුතු නොකිරීමෙන් රු.552,100 ක ආදායමක් සභාවට අහිමි වීමේ අවදානමක් පැවතුණි.

(ආ) කඳුරුගස්ආර හා තෙරුන්නාන්සේගම ජල ව්‍යාපෘති සඳහා බිල්කල ආදායම රු. 671,500 ක් වුවත් රු. 780,478 ක් ලැබී තිබුණි. රු. 1,195,529 ක වියදම ඒ වෙනුවෙන් සභා අරමුදලින් දරා තිබුණි. මේ අනුව රු. 415,051 ක මෙහෙයුම් අලාභයක් සභාවට දැරීමට සිදුවී තිබුණි. තවද, 2015 ඔක්තෝබර් 31 දිනට යථෝක්ත ජල ව්‍යාපෘති දෙකෙහිම හිඟ ජල ගාස්තු ශේෂය රු. 1,586,656 ක්වූ අතර, එයින් රු. 5,000 ට වැඩි හිඟයක් පවතින ජල පාරිභෝගිකයන් 108 දෙනෙකුගෙන් රු. 1,087,845 ක් අයවිය යුතුව තිබුණි.

(ඇ) යථෝක්ත ජල ව්‍යාපෘති වල ජල පාරිභෝගිකයින් 162 දෙනෙකුගෙන් 2012 වර්ෂයටද පෙර වර්ෂ වල සිට රු. 1,947,721 ක හිඟ ශේෂයක් අයකර ගත යුතු විය.

(ඇ) පළාත් පාලන කොමසාරිස්ගේ 2009 මාර්තු 09 දිනැති අංක 2009/01 දරන චක්‍රලේඛයේ නියමයට පටහැනිව ප්‍රාදේශීය සභාව විසින් සතිපොල හා මාළුකඩ දේපල බදු දීමේදී අවම ලංසුව වර්ෂ ගණනාවක සිට එකම වටිනාකමකට තීරණය කර බදු දී තිබූ බව

2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු
------------------------------
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව අයවිය යුතු උසාවි දඩ වටිනාකම හඳුනා ගෙන ඇතත්, සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි සිට දෙසැම්බර් දක්වා වූ උසාවි දඩ අයකර ගැනීමට විගණන දිනය වනවිටත් සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) ඇඹිලිපිටිය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් සමාලෝචිත වර්ෂය සඳහා ලැබීමට ඇති මුද්දර ගාස්තු හඳුනාගෙන ඇතත්, පසුගිය වර්ෂයේ නොවැම්බර් සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් දක්වා වූ මුද්දර ගාස්තු අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

03. මෙහෙයුම් සමාලෝචනය
------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා
------------------------------------
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලේඛණ යාවත්කාලීන නොවීම හෝ ලබාගත් අත්තිකාරම් නොපියවීම මත දීර්ඝ කාලයක සිට පැවත එන රු. 2,539,786 ක නොපියවූ අත්තිකාරම් ශේෂයක් පැවතිනි.

(ආ) සභාවට අවශ්‍ය වීථි පහන් සහ අනෙකුත් උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 245,825 ක් ගෙවීම් කර තිබුණි. සභාව විසින් මිලදී ගත් වීථි පහන් සවි කළ ස්ථාන හඳනා ගැනීමට නොහැකි විය.අළුත්වැඩියා කිරීමේදී ගලවා ඉවත් කරන ලද හා නැවත අළුත්වැඩියා කර භාවිතයට ගතහැකි වීථි පහන් සම්බන්ධයෙන්ද විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) 2015 මැයි 15 දින සිට සභාවේ නිල කාලය අවසන් වී තිබුණි. සභිකයින් වෙත මැයි මස සඳහා මන්ත්‍රී දීමනා වශයෙන් රු. 225,000 ක් ගෙවා ඇති නමුත් ප්‍රතිපූර්ණය වී තිබුණේ ඔවුනට හිමි දින 15 ක දීමනාව පමණි. තවද, ඉන් එක් මන්ත්‍රීවරයෙකුට වැඩිපුර ගෙවූ රු. 7,500 ක් ආපසු සභාවට නැවත ගෙවා තිබුණි. ඒ අනුව වැටුප් වියදම රු. 105,000 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබූ අතර, ප්‍රාදේශීය සභාව විසින් මන්ත්‍රීවරුන්ගෙන් අයකර ගත යුතු රු. 105,000 ගිණුම් මඟින් හෙළිදරව් කර නොතිබුණි.

3.2 අවිධිමත් ගණුදෙනු
--------------------

(අ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2:8:4 ප්‍රකාරව ප්‍රසම්පාදන බලධාරී විසින් තාක්ෂණික මිලදී ගැනීම් හීදී තාක්ෂණික ඇගයීමක් සිදුකල යුතු වුවද, ප්‍රාදේශීය සභාවේ මිලදී ගැනීම් තාක්ෂණික ඇගයීමකින් තොරව සිදු කරන අතර, මාර්ගෝපදේශ සංග්‍රහයේ 8:12:3 ප්‍රකාරව සපයන ලද භාණ්ඩ නියමිත පිරිවිතරයන් හා වෙනත් එකඟවූ නියමයන්ට අදාල වියයුතු වුවත්, ඒ සම්බන්ධයෙන්ද තාක්ෂණික දැනුමක් ඇති පුද්ගලයෙකු විසින් අදාල නිර්දේශ ලබා දී නොතිබුණි. එපරිදි කටයුතු කිරීමෙන් තොරව අඩුම මිල පමණක් පදනම් කර ගනිමින් මිලදී ගැනීම් සිදුකර තිබුණි.

(ආ) ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල විවෘත කිරීමේ උත්සවය සඳහා රු. 470,000 ක් වියදම් දරා තිබියදී එම වියදම් සඳහා 2011 ජනවාරි 04 දින ලබාගත් රු.100,000 ක අත්තිකාරම් තවදුරටත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා පියවීමට අපොහොසත් වී තිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

(අ) සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ග්‍රාමීය ප්‍රවේශ මාර්ග සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ක්‍රියාත්මක කල පනහඩුව සේරුව පාර බොරළු යොදා සංවර්ධනය කිරීම සඳහා කාර්මික නිලධාරිගේ රු. 499,280 ක ඇස්තමේන්තුවක් මත මාස 03 ක කාල සීමාවක් තුල ඉටු කිරීම සඳහා පල්ලේබැද්ද එකමුතු ග්‍රාම සංවර්ධන සමිතිය සමඟ රු. 499,980 ක වටිනාකමැති ගිවිසුමකට 2015 මාර්තු 26 දින එළඹ තිබුණි. උක්ත කර්මාන්තය සම්බන්ධයෙන් 2015 දෙසැම්බර් 08 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී නියමිත ප්‍රමිතියෙන් යුතු බොරළු පස් යොදා නොතිබීම හේතුවෙන් වර්ෂා කාල සීමා වලදී ඇති වූ දැඩි ජල දහරාවක් මාර්ගය මතින් ගලා යාම හේතුවෙන් යොදන ලද බොරළු පස් සේදී යාම සිදුවී විශාල ප්‍රමාණයේ ගල් බොරළු මතුවී තිබු බව නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේදී කර්මාන්ත 05 ක් සඳහා අත්තිකාරම් ලෙස රු. 730,000 ක් ගෙවා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් උක්ත අත්තිකාරම් පියවීම සඳහා කටයුතු කර නොමැති අතර, කර්මාන්ත වැඩ ආරම්භ කර හෝ නොතිබුණි.

3.4 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

2006 නොවැම්බර් 08 දිනැති ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියට අදාල ගිවිසුම ප්‍රකාරව සභා බල ප්‍රදේශයේ භූමිභාගයක ඉදිකර ඇති ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයට සභා බල ප්‍රදේශයේ කසල වර්ගීකරණය කර ගෙනගොස් භාරදෙනු වෙනුවෙට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් භූමියක ගොඩගැසීම පමණක් සිදු කර තිබුණි. චන්ද්‍රිකා වැවට ආසන්න ඉඩමක මෙලෙස විශාල ප්‍රමාණයෙන් ගොඩගසා ඇති කුණු ගොඩවල් නුදුරු දිනක නගරයේ ප්‍රධාන ජල මූලාශ්‍රය වන වැවට හා පරිසරයට දැඩි බලපෑමක් සිදු කිරීමේ අවදානමක් පැවතුණි.

3.5 වත්කම් කළමනාකරණය.

-----------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු ලියාපදිංචි අංක LL – 6987 දරණ ෆෝටෝන් ටිපර් රථය සේවාදායකයන් වෙත කුලියට දීම සඳහාද සභා කර්මාන්ත සඳහාද යොදවා ගන්නා නමුත් එසේ භාවිතා කරන ලද්දේ කුමන කර්මාන්තයක් සඳහාද යන්න හෝ කුලියට ලබාදී ආදායම් ලබා ගැනීම පිළිබඳව සටහන් හෝ ලේඛණ පවත්වා නොතිබුණි.

(ආ) ලියාපදිංචි අංක MG – 330 දරණ මෝටර් ග්‍රේඩරය කුලියට දීම මෙන්ම යන්ත්‍රය බැහැර ගෙන යාමේදී ලේඛණයක සටහන් කර නොතිබුණි. යන්ත්‍ර ක්‍රියාකරුගේ අවශ්‍යතාවය මත වරින් වර පරිශ්‍රයෙන් රැගෙන යන බව ලිපිගොනු අනුව හා 2015 දෙසැම්බර් 4 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. තවද, ධාවන සටහන් නඩත්තු කිරීමේදී ඉන්ධන ලබා ගැනීම හා භාවිතය පිළිබඳ නොලසකා කටයුතු කර තිබූ අතර, බොහෝ අවස්ථා වල ඉන්ධන ලබාගත් ප්‍රමාණයම භාවිතයට ගත් බව දක්වා ඉන්ධන තුලනය කර තිබුණි. ඒ අනුව 2014 වර්ෂය තුලදී වැය කර ඇති රු. 85,743 ක ඉන්ධන වියදම සත්‍ය අවශ්‍යතාවය

මත දරණ ලද වියදමක්ද යන්න ගැටළුසහගත වූ අතර, 2014 දෙසැම්බර් 29 පසු කිසිදු ධාවන සටහනක් විගණනයට ඉදිරිපත් නොවූ අතර, වාහන භාර නිලධාරී වෙතද ධාවන සටහන් ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) ලියාපදිංචි අංක SG AAQ – 5005 දරණ ත්‍රීරෝද රථයේ ධාවන සටහන් ඉතාමත් අපහැදිලිව ලියා තිබූ අතර, ඉන්ධන තුලනය දැඩි දෝශ සහිතව පවත්වා තිබූ බැවින් 2015 වර්ෂය තුලදී ලබාගත් රු.77,682 ක් වටිනාකමැති ඉන්ධන ලීටර් 643.77 ක් සත්‍ය අවශ්‍යතාවයට මිලදී ගෙන තිබුණේද යන්න ප්‍රශ්නකාරී විය.

(ඈ) අංක RA – 5735 දරණ ට්‍රැක්ටරය හා අංක LF – 4834 දරණ මහේන්ද්‍රා කැබ් රථය ධාවනයෙන් ඉවත් කර සභා පරිශ්‍රයේ ගාල් කර තිබූ නමුත් එම වාහන ධාවනයෙන් ඉවත් කිරීමට හේතුව හෝ ධාවනය නොවන බවට ලිපිගොනු අනුව විගණනයට තහවුරු නොවුණි.

(ඊ) සභාව විසින් 2015 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණය සිදුකර අදාල වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

3.6 පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම

---------------------------------------------------------------

(I) තුංකම ප්‍රධාන කාර්යාල ඉඩම, පල්ලේබැද්ද උප කාර්යාල ඉඩම, පනාමුර පුස්තකාල ඉඩම, මුදුන්මංකඩ ක්‍රීඩාපිටිය, පනාමුර, පල්ලේබැද්ද හා උඩවලව ආදී සතිපොලවල් පිහිටි ඉඩම්, වල්ලැව, පනාමුර, කුට්ටිගල පදලංගල, ජුලංගැටේ ලංයනගහතොට හා 96 යන සුසාන භූමි වශයෙන් වන ඉඩම් හා දේපල වල අයිතිය පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(II) අංක RC – 1402, අංක RD – 6440, අංක RD – 7993 දරණ ස්ටෑන්ඩට් ට්‍රැක්ටර්, අංක RA – 5735 දරණ ෆාම්ට්‍රැක් ට්‍රැක්ටරය, අංක LL – 7529 දරණ ෆෝටෝන් කෑබ කැබ් රථය, අංක LL – 6987 දරණ ෆෝටෝන් ටිපර් රථය හා අංක ZA – 5014 දරණ ෆෝටෝන් බැකෝ ලෝඩර් යන්ත්‍රය සභාවට ලබාදුන් ආයතන තුලින් සභාවේ නමට පැවරීමේ කටයුතු සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අවසන්වී නොතිබුණි.

## 04. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය.

------------------------------------------

### 4.1 අයවැය පාලනය.

-------------------

වැය විෂයයන් 20 ක් සඳහා 2015 වර්ෂයේදී රු. 3,972,128 ක් ප්‍රතිපාදනය කර තිබුණද, එම වැය විෂයයන් 20 න් කිසිදු වියදමක් දරා නොතිබුණි.

### 4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර ඒ අනුව කටයුතු කර නොතිබුණි.

### 4.3 අභ්‍යන්තර විගණනය

------------------------

අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා ඒ සඳහා අවශ්‍ය පහසුකම් සපයා ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

4.4 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

---------------------------------------------------------

විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.

05. පද්ධති හා පාලනය

-----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමණාකරණය

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය